**මොරවැව ප්‍රාදේශීය සභාව**

**------------------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**------------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 24 දින මාස 07 ක ප්‍රමාදයකින් පසුව ද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 22 දින මාස 13 ක ප්‍රමාදයකින් පසුවද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතවරයාගේ වාර්තාව 2015 මාර්තු 25 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** සේවක ණය ලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,053,056 ක් වූ සේවක ණය ශේෂය රු. 742,617 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සේවක ණය රු. 310,439 ක අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

**(ආ)** සභාව විසින් පසුගිය වර්ෂවල දී දෙනලද අත්තිකාරම් වලින් නොපියවූ අත්තිකාරම් රු. 221,981 ක් ඍණ ශේෂයක් ලෙස ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ජංගම ගිණුමක් සඳහා මුදල් පොතක් පවත්වා ගැනීමට කටයුතු නොකර එම ජංගම ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වූ රු. 537,548 ක් බැංකු ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම

අවිනිශ්චිත ගිණුම් ශේෂය වශයෙන් දැක්වුණු රු. 7,864,759 ක මුදලක් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකළ බැවින් එම ගිණුම් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම (රු) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 44,423,507 | විස්තරාත්මක උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය |
| ලැබිය යුතු ගිණුම් | 950,536 | ශේෂ සනාථ ලිපි ,කාලවිශ්ලේෂණ වාර්තා, විස්තරාත්මක උපලේඛනය |
| ගෙවිය යුතු ගිණුම් | 214,315 | |

### 1.3.4 නීති,රීති, රෙගුලාසිවලට අනුකුල නොවීම

විගණනයේ දී නිරික්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකුල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) 1989 අප්‍රේල් 17 දින අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය. | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 19 දින දක්වා සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | පලාත් පාලන, පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 05 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/22 දරන චක්‍රලේඛයේ 3 ජේදය | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,652,482 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 512,284 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 213 | - | - |
| බදු කුලී | 1,050 | 1,704 | 22 |
| බලපත්‍ර ගාස්තු | 233 | 69 | - |
| වෙනත් ආදායම් | 6,780 | 2,803 | - |

2.2.2 උසාවි දඩ
-------------

නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතු මුදල් හදුනාගැනීමට සහ ලබා ගැනීමට විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 19 දින වන විටද කටයුතු කර නොතිබුණි.

03. **මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2014 ජනවාරි 20 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන්ට අනුව භාණ්ඩ වර්ග 13 ක් අළුත්වැඩියා කිරීමටත් , භාණ්ඩ වර්ග 09 ක් ඉවත් කිරීමටත් , භාණ්ඩ වර්ග 10 ක් විනාශ කිරීමටත් අවශ්‍යය කටයුතු කර නොතිබුණි.

**(ආ)** දෛනික ලැබීම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබීම නිසා පැයක ගාස්තුව රු. 3,500 **බැගින්** කුලියට දෙනු ලැබූ JCB යන්ත්‍රයෙන් ලැබෙන ආදායම් වාර්තා කර නොතිබුණි.

**(ඇ)** JCB යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මාසික වාරික 60 කින් ගෙවා නිම කිරීමට ලබාගත් රු. 9,520,000 ක ණය මුදල වෙනුවෙන් 2014 දෙසැම්බර් 19 දින වන විට මාසික වාරික 08කට අදාල රු. 1,580,807 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ)** අනතුරකින් දැඩිලෙස අලාභහානි වී ඉවත් කර තිබූ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට **අයත්** කැබ් රථයක් රු.මිලියන 1.8 ක විශාල මුදලක් වියදම් කර සභාව විසින් 2012 මැයි 24 දින අළුත්වැඩියාකර භාවිතා කරනු ලැබුවද එය සභාවට පවරා ගැනීමට විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 19 දින වන විට ද කටයුතු කර නොතිබුණි.

**(ඉ)** සමාලෝචිත වර්ෂයේ දී රු. 237,100 ක් ගෙවා සවි කර තිබූ WiFi අන්තර්ජාල පද්ධති සන්නිවේදන සම්බන්ධතා නොලැබීම හේතුවෙන් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 19 දින වන විටද ක්‍රියාවිරහිතව තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.2.1 ඇතාබැඳිවැව ප්‍රධාන මාර්ග ඉදිකිරීම

මෙම මාර්ගයේ දෙවන අදියර කි.මී. 2ක් ගල් අතුරා තාර දමා ඉදිකිරීම සඳහා රු. 18,046,600 (වැට් රහිත ) ක වටිනාකමකට මාස තුනක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 මැයි 31 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

**(අ)** මෙම මාර්ගයේ ඉදිකිරීම් කාර්යය සාධනය සතුටුදායක මට්ටමක නොතිබීම හේතුවෙන 2012 ඔක්තෝබර් 08 දින වන විට රු. 2,954,923 ක් ගෙවීමෙන් පසුව කොන්ත්‍රාත්තුව නවතා දමා 2014 මාර්තු 13 දින රු. 19,577,095 (වැට් රහිත) ක කොන්ත්‍රාත් වටිනාකමකට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. පසම්පාදන ක්‍රියාවලියේ දී කොන්ත්‍රාත්කරුවන් ඇගයීම් කර වඩා සුදුසු කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම නිසා රු. 4,485,418 ක් අතිරේකව ගෙවීම් කිරීමටත්, නියමිත කාලය තුල ඉදිකිරීම් සම්පූර්ණ නොකිරීමටත් සිදු වී තිබුණි.

**(ආ)** කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් සතුටුදායකව සිදු නොකරන අවස්ථාවේ දී කාර්යය සාධන බැඳුම්කරයේ කාලය අවසන් වීමට පෙර කාර්යය සාධන බැඳුම්කරය මුදල් කර නොගැනීම නිසා එහි වටිනාකම වූ රු. 902,330 ක් සභාවට අහිමි වී තිබුණි.

**(ඇ)** මෙම මාර්ගය ඉදි කිරීමේ දී 1+250 සිට 1+450 අතර ස්ථාන කිහිපයක කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියට නොතිබීම සහ කොන්ක්‍රීට් ඝනකම අඟල් 6 ට වඩා අඩුවෙන් තිබීම මත එම ස්ථානයන්ට යෙදූ කොන්ක්‍රීට් 30 $m^3$ ප්‍රමාණයෙහි දිගු කාලීන පැවැත්මට ගැටළුවක් සිදු වී තිබුණි.

**(ඈ)** 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 19,265,499 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 48,164 ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.2.2. **ප්‍රාදේශීය සභා සඳහා පුස්තකාලයක් ඉදි කිරීම**

දැයට කිරුළ ව්‍යාපෘතිය මගින් පුස්තකාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහලය ඉදිකිරීම සඳහා රු. 7,048,316 ( වැට් රහිත) වටිනාකමකට මාස තුනක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2013 ජනවාරි 22 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරු රු. 2,421,104 ක කල වැඩ වටිනාකමට 2013 පෙබරවාරි මස 12 දින ඉදිරිපත් කරන ලද පළමු බිල සඳහා මාස 12 ක කාලයකින් පසු 2014 අප්‍රේල් මස ගෙවීම නිසා 2013 ජූන මස සිට කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් නවතා දමා තිබුණි. කොන්ත්‍රාත්කරු 2014 සැප්තැම්බර් සිට නැවත ඉදිකිරීම් ආරම්භ කර තිබුණත් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 16 දින වන විට ද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ආ) රු. 352,420 ක් වටිනා කාර්යය සාධන බැදුම්කරය 2013 අප්‍රේල් 23 දින අවසන් වී ඇති නමුත් එය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහලය ඉදිකිරීම සඳහා **වූ රූපසටහන්** අනුව කොන්ක්‍රීට් කණු 21 ක් සඳහා එක් කණුවකට 16 mm යකඩ කම්බි 04 ක් සහ 12 mm යකඩ කම්බි 04 බැගින් යෙදිය යුතු වුවද එක් කණුවකට **මි.මී.12** කම්බි 02 ක බැගින් **යොදා සකසන ලද** කොන්ක්‍රීට් කණු 21 ක් ඉදිකර තිබුණි. ඒ අනුව යකඩ කම්බි **කි.ග්‍රෑ.**77 කොන්ක්‍රීට් කණු සඳහා යොදා නොගැනීම **නිසා** ගොඩනැගිල්ලේ දිගු කාලීන පැවැත්ම ගැටළුවක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් **මතුකළ විගණන විමසුමට ප්‍රතිචාර වශයෙන් සභාවේ ලේකම් විගණකාධිපතිට දන්වා සිටියේ** එවකට සේවය කල කාර්මික නිලධාරී හා ඉංජිනේරුවරයා මේ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගත යුතු බවත් **දැනට ඔවුන් ස්ථාන මාරු මත සභාවෙන් පිටතට ගොස් ඇති බවත්ය.**

3.3 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සහ තත්‍ය වියදම සියයට 28 සිට සියයට 58 දක්වා පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | 01 | - |
| ද්විතික මට්ටම | 14 | 05 | 09 |
| තෘතීය මට්ටම | 16 | 08 | 08 |
| **එකතුව** | 31 | 14 | 17 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2014 අප්‍රේල් මස සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 19 වන විටද කටයුතු කර නොතිබුණු අතර, වැඩබැලීමේ පදනම මත ලේකම්වරයෙකු පත්කර තිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, සංවර්ධන නිලධාරී , රියදුරු , යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

## 04. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) අයවැය පාලනය